(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 9(8).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 නොවැම්බර් මස 23 වැනි සෙනසුරාදා**

---

## 2013 දෙසැම්බර් මස 02 වැනි සඳුදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ඔක්තෝබර් 19 දිනැති අංක 1780/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59 වැනි වගන්තිය සමග කියවිය යුතු 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 14 දිනැති අංක 1788/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමග කියවිය යුතු 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජූලි 27 දිනැති අංක 1768/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 07 දිනැති අංක 1774/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 10 දිනැති අංක 1770/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2013 දෙසැම්බර් මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3656/'13

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහින්ද චින්තනයේ පිටු අංක 47හි ආබාධිත, වයෝවෘද්ධ සමෘද්ධිලාභියෙකු සිටින පවුල් සඳහා රුපියල් 3000/- ක මාසික දීමනාවක් ලබා දෙන බවට සඳහන්ව ඇති බවත්;

(ii) මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි පිටු අංක 193 අනුව එය තහවුරු කර ඇති බවත්;

(iii) ඉහත සඳහන් ප්‍රකාශයන් අනුව හිමිවන දීමනාව ලබා ගැනීම සඳහා ආබාධිත තත්ත්වයේ පසුවන සමෘද්ධි සහනාධාරලාභියෙකු වන කුරුණෑගල බමුණාකොටුව, කඩිහාරයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. බී. ඒ. වීරසේකර මහතා 2012.05.14 දින දුබලතා ඇති පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලයට අයදුම්පතක් යොමු කර ඇති බවත්;

(iv) එම අයදුම්පත මේ වන විට පොරොත්තු ලේඛනයට ඇතුළත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රුපියල් 3000/- ක දීමනාව ලබාගැනීමට 2012.05.21 දින සිට පොරොත්තු ලේඛනයේ සිටින වීරසේකර මහතාට එම දීමනාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3695/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා බැංකුව මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් ලංකා බැංකුව විසින් වැයකරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයකු පත්වූ විට ඊට අදාළව ලංකා බැංකුවට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3655/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති, ශිෂ්‍ය සංඛ්‍යාව 30ට අඩු පාසල් කවරේද;

(ii) එම එක් එක් පාසලේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් වැඩි දියුණුකර සිසුන් සංඛ්‍යාව වැඩි කර ගැනීමට හෝ මෙම පාසල් එම තත්ත්වයෙන්ම තවදුරටත් පවත්වාගෙන යාම සුදුසුද යන්න පිළිබඳව අධ්‍යයනයකර තිබේද;

(ii) එසේ නම්, ඒ අනුව වැඩි දියුණු කරන ලද පාසල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීමේ හේතුව මත පසුගිය වර්ෂ 5 තුළ අම්පාර දිස්ත්‍රික්කයේ වසා දමන ලද පාසල් කවරේද;

(ii) එම සිසුන් සඳහා වෙනත් පාසල් ලබාදීමට කටයුතු කර තිබේද;

(iii) වසාදමන ලද එම පාසල් ගොඩනැගිලිවල වත්මන් තත්ත්වය කවරේද;

(iv) එම ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබේද;

(v) එසේ නම්, එම කටයුතු කවරේද;

(vi) නොඑසේ නම්, මෙම ගොඩනැගිලි පාවිච්චියට නොගෙන වල් බිහිවීමට ඉඩහැර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3694/'13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය දැව සංස්ථාව මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළකිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථාව විසින් වැයකරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයෙකු පත්වූ විට, ඊට අදාළව රාජ්‍ය දැව සංස්ථාවට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2681/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති නොතකා සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම පෞද්ගලීකරණය කිරීමට හෝ එහි කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට පැවරීමට හේතුව කවරේද;

(ii) එහි නව හිමිකරුවන්ගේ හෝ කළමනාකරණ හවුල්කරුවන්ගේ නම් සහ අදාළ ගිවිසුම කවරේද;

(iii) එහි කළමනාකරණ ගිණුම් ඉදිරිපත් කරන ලද දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඒවා ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගමට අයත් ඉඩම් විදේශිකයින්ට විකිණීමට හේතු කවරේද;

(ii) එම ඉඩම්වල විකුණුම් මිල කොපමණද;

(iii) ඉහත කී ගනුදෙනුවට අදාළ 100% බද්ද ගෙවා තිබේද;

(iv) එසේ නම්, එය ගෙවන ලද දිනය කවරේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ඉඩම් ගනුදෙනුව සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදුකරන ලද්දේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් උපදේශක කමිටුවේ හෝ තේරීම් කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) නොඑසේ නම්, එය සිදු කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3362/'12

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 07 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2510/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 මාර්තු මාසය තුළ ජිනීවාහි පැවැත්වූ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිසට අයත් වූ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සැසිවාරයට සහභාගී වූ අයගේ නම් සහ තනතුරු කවරේද;

(iii) එම දූත පිරිස සඳහා වැයවූ මුළු මුදල කොපමණද;

(iv) මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් වූ යෝජනාව පරාජය කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ ක්‍රමෝපායන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3352/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 09 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2448/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන නිල්වලා යෝජනා ක්‍රමය යටතේ ගංවතුර පාලනය කිරීම සඳහා පිහිටුවා ඇති පොම්පාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පොම්පාගාරය පිහිටා ඇති ස්ථානය කවරේද;

(iii) එම පොම්පාරගාරවලින් දැනට අක්‍රීයව පවතින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගංවතුර පාලනය කිරීම සඳහා පිහිටුවා ඇති පොම්පාගාර අක්‍රීයව පැවතීම නිසා නිල්වලා යෝජනා ක්‍රමය තුළින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පොම්පාගාර කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2465/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අයත් ක්‍රිකට් ක්‍රීඩාංගණ සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම වියදම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම ප්‍රාග්ධන සහ පොලී සංරචක අනුව කොපමණද;

(iii) අ (i) හි සඳහන් ක්‍රිකට් ක්‍රීඩාංගණවලින් ලබාගත් ආදායම එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2509/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල් පවත්වාගෙන යනු ලබන ගම්මාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පෙර පාසල්වල භෞතික සම්පත් ඌනතා රැසක් පවතින බව පිළිගන්නේද;

(ii) එම ඌනතාවයන් මඟහැරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම ඌනතා සම්පූර්ණ කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3697/'13

ගරු අනුර දිසානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් 2013.03.06 දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වැයකරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක යම් තනතුරක් සඳහා යම් පුද්ගලයකු පත්වූ විට ඊට අදාළව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 11 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3696/'13

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සී/ස ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළකිරීමේ අරමුණ කවරේද;

(iii) එම දැන්වීම වෙනුවෙන් එම සමාගම වැයකරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයකු පත්වූ විට ඊට අදාළව සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1895/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය වසා දමා වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;

(ii) මෙම විද්‍යාලය සතුව පැවති ගොඩනැගිලි කිහිපයක් මේ වනවිට විනාශ වෙමින් පවතින බවත්;

(iii) එම විද්‍යාලය සතුව අක්කර හතක පමණ භූමි ප්‍රමාණයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යාය ගාමිණී කණිෂ්ඨ විද්‍යාලය සතු ගොඩනැගිලි සහ භූමිභාගය විනාශයට පත්වීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

(ii) එම විද්‍යාලය සතු සම්පත් යොදා ගනිමින් කර්මාන්තශාලාවක් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සැපයිය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් මතු යෝජිත පරිදි යොදා ගැනීමට සැලසුම් කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2714/'12

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වන විට මෙරට තිබෙන ජාතික රෝහල් සංඛ්‍යාව සහ පෞද්ගලික රෝහල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) එම රෝහල්වල,

(i) රෝගීන් සඳහා ඇති මුළු ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඳන් සංඛ්‍යාව සහ වෛද්‍යවරු සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iii) එම ඇඳන් සංඛ්‍යාව සහ හෙද-හෙදියන් සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iv) රෝගීන් සංඛ්‍යාවට, හෙද-හෙදියන් සංඛ්‍යාවට, වෛද්‍යවරුන් සංඛ්‍යාවේ අනුපාතය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2559/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2010 දක්වා වූ එක් එක් වර්ෂයේදී අධ්‍යාපනය වෙනුවෙන් වැය කළ සමස්ත මුදල එම එක් එක් වර්ෂයෙහි දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහත පරිදි වෙන් කළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයන් ඒ සඳහා ප්‍රමාණවත්වී තිබේද;

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින වත්මන් තත්ත්වය අනුව එහි දියුණුව උදෙසා දැනට වඩා වැඩි මුදලක් වෙන් කළ යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3363/'12

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 14 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2511/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුමක් ඇති ගම්මාන කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුම නොමැති ගම්මාන කවරේද;

(iii) එම ගම්මානවලට පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර කාල වකවානුවක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබාගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගණනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීළඟ දැයට කිරුළ ප්‍රදර්ශනයන් තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2457/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මීට වර්ෂ හතරකට පමණ පෙර මුල්ගල් තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වෙන්කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන සපයන ලද ආයතනය කුමක්ද;

(iii) ප්‍රතිපාදන සපයා තිබේ නම්, ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3261/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට පවරාගත් ඉඩම්වල දළ තක්සේරු වටිනාකම හා භූමි ප්‍රමාණය කොපමණද;

(ii) පවරාගත් එම ඉඩම් අයත් ප්‍රදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව සහ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) කටුනායක අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පවරාගත් ඉඩම්වල වටිනාකම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2569/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ දී අති විශේෂ ගැසට් නිවේදනයකින් රක්ෂිත ප්‍රදේශයක් බවට ප්‍රකාශිත බුලත්සිංහල, වගුරාන වනාන්තරය විනාශයට පත්වෙමින් පවතින බවත්;

(ii) ඉතා දුර්ලභ ශාක හා සත්ව සම්පත්වලින් අනූන මෙම වනාන්තරය රැක ගැනීමට ආරක්ෂක නිලධාරීන් යොදවා නොමැති බවත්;

(iii) එම වනාන්තරය නැරඹීමට එන අය සඳහා තොරතුරු සැපයීමේ වැඩපිළිවෙළක් නොමැති බවත්;

(iv) බටපොත ඇල ඔස්සේ වගුරාන වනාන්තරයට කැළි කසළ ගලා ඒම වැළැක්වීමට වැඩපිළිවෙළක් සලසා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් සංවේදී පරිසර කලාපයට ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ සේවය කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2718/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ සිට අද දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු මුදල් සංචිත වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් වර්ෂය ආරම්භයේදී සැලසුම් කරන ලද පරිදි එකී අය-වැය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නොහැකි වී තිබේද;

(iii) එසේ නම්, එම තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක්‍රිකට් තරඟවල විකාශන අයිතීන් අලෙවිකිරීම තුළින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2009, 2010, 2011 සහ 2012 වර්ෂවලදී ඉපැයූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2449/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අකුරැස්ස සහ අතුරලිය ප්‍රාදේශීය සභා මගින් එකතු කරනු ලබන කැළි කසළ ගොඩපිටිය, පානදුගම, කණහලාගම, ගවුස්වත්ත සහ ගොළුවත්තහේන යන ගම්මාන මධ්‍යයේ පිහිටා ඇති රෂිනාවත්ත නම් ස්ථානයට ගෙනවිත් දමනු ලබන බවත්;

(ii) එම ස්ථානයේ කැළි කසළ රැස්කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි සෞඛ්‍ය තර්ජනයකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෂිනාවත්ත නමැති ස්ථානයට කැළි කසළ ගෙනැවිත් දැමීම නවතා දැමීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට කැළි කසළ දැමීම සඳහා විකල්ප ස්ථානයක් තෝරාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සංචාරක පුරවරයක් වන අලුත්ගම නගරයේ පුළුල් මාර්ග පද්ධතියට සරිලන පරිදි ක්‍රමවත්ව සකසා නොමැති කාණු පද්ධතියේ අපද්‍රව්‍ය රැඳී අවහිරවීම නගරය පුරා දුර්ගන්ධයක් පැතිරයාමට හේතුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලබන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) අලුත්ගම නගරයේ ඉදිකළ නව බස් නැවතුම්පළෙහි කඩ සාප්පු මේ වනතෙක් වෙළෙඳුන්ට ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2562/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයන් හට ලැබෙන මාසික වේතනයන් කොපමණද;

(ii) එම නියෝජිතයින්ට ප්‍රමාණවත් වේතනයන් ලැබෙන්නේද;

(iii) පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයින්ට ජනතා සේවාවන් ඉටුකිරීම සඳහා ලබා දෙන පහසුකම් හා දීමනා කවරේද;

(iv) ප්‍රශස්ත ජනතා සේවාවක් ඉටුකිරීමට එම දීමනා හා පහසුකම් ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2716/’12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජය විසින් 2012 වර්ෂයේදී ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකරන ලද ආයතන කවරේද;

(iii) මෙසේ වියදම් කරන ලද මුදල් ලබාගත් මූලාශ්‍ර කවරේද;

(iv) අයිතිකරුවා විසින්, ඔහු හෝ ඇය ලද නිවස සඳහා ගෙවිය යුතු මුදල කොපමණද?

(v) නිවාස වෙන්කොට ඇති අයගේ නම් ලැයිස්තුව කවරේද;

(vi) ඉහත දක්වා ඇති නිවසකට ගෙවනු ලබන ඉදිකිරීම් වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?